# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1646 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 31/12/2023<br>පැය 1130 |

**මාධ්‍ය නිවේදනය**

**විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම සම්බන්ධ වාර්තාව - පොලිස් මූලස්ථානය.**

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට විශේෂ මෙහෙයුම් ආරම්භ කර ඇත.

එයට සමගාමීව 2023.12.30 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 1414 කට අදාලව සැකකරුවන් 1369 ක් සහ සැකකාරියන් 37 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 86 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර 01 සැකකරුවකුගේ වත්කම් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීමට නියමිතය. තවද සැකකරුවන් 49 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 327 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 206ක්, ගංජා ග්‍රෑම් 525 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 716 කදී සැකකරුවන් 695 ක් හා සැකකාරියන් 21 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 24 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25 ක් හා ගංජා ග්‍රෑම් 392 ක් ද පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 139 කදී සැකකරුවන් 138 ක් හා සැකකාරියන් 01 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත පරිදි සඳහන් කර ඇත.

2023.12.30 වන දින සිදු කරන ලද වැටලීම් සම්බන්ධ වාර්තාව.

| | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය (g / mg) | 515.557 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 313.225 |
| ගංජා | ප්‍රමාණය (g / mg) | 3130.037 |
| | ගංජා පැළ | 64036 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 1865.13 |
| මත්පෙති | | 882 |
| මුළු වැටලීම් ගණන | | 1414 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 37 |
| | පුරුෂ | 1369 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිත සැකකරුවන් ගණන | | 86 |
| වත්කම් විමර්ශන ආරම්භ කිරීමට නියමිත සැකකරුවන් ගණන | | 01 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන | | 49 |

2023.12.17 වන දින සිට 2023.12.30 වන දින දක්වා සිදු කරන ලද මුළු වැටලීම් සම්බන්ධ වාර්තාව.

| | |
|---|---|
| මුළු වැටලීම් ගණන | 19662 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | 19513 |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**